# කනේරු මල්



පී.එච්. අනුසරා අභිෂේකනී රණවීර

# කනේරු මල්

ජී.එච්. අනුසරා අභිෂේකනී රණවීර

# කනේරු මල්


## ජී.එච්. අනුසරා අභිෂේකනී රණවීර


**කර්තෘගේ වෙනත් කෘති**

**සිතුවිලි ගෙත්තම් (**ISBN 978-624-208-824-4**)**

**බසෙහි වරුණ (**ISBN 978-624-208-996-6**)**

**පාසල** : මහ/ස්වර්ණමාලි බාලිකා විද්‍යාලය

**ඉගෙනුම ලබන පන්තිය** : **10 ශ්‍රේණිය**

**කෘතිය පළ කරන දිනය** : **2026.04.25**


**ISBN අංකය : 978-624-211-076-9**

# පිදුම

නිති මගේ යහපත
වෙනුවෙන්ම වෙහෙසෙන
මගේ මෑණියන්ටත්, අප්පච්චිටත්,
අයනු ආයනු කියාදුන්
සිදුහත් විදු පියසේ
ගුරු මෑණිවරුන්ටත්, පියවරුන්ටත්
ස්වර්ණමාලි බාලිකා විදුහලේ
ගුරු මෑණිවරුන්ටත්, පියවරුන්ටත්,
බස පිරික්සමින් නිති ඔවදන් දෙන
සිසිර ගමගේ සියාටත්
මෙම ග්‍රන්ථය පුදමි...



# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂ්‍යයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදු කරන හේමමාලා උපහාර ගත්කරන ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය ,
පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

# හැඳින්වීම

මිනිසාගේ ජීවිතය කියන්නේ කතා ගොඩක එකතුවකි. සතුට, දුක, බලාපොරොත්තුව, බලාපොරොත්තු කඩවීම, ආදරය, තරහව, කැපවීම - මේ හැම හැඟීමක්ම වචන බවට පෙරළෙන තැන කෙටි කතාවක් උපදියි.

මේ සංග්‍රහය තුළ ඇත්තේ එවැනි ජීවිතයෙන් උකහා ගත් කතා කිහිපයකි. සමහර කතා ඔබේ ගමේ, ඔබේ ගෙදර, ඔබේ හිතේ සිදුවන්නට ඇති දේවල්ය. තවත් සමහරක් ඔබ නොදන්නා මිනිසුන්ගේ නොදන්නා ලෝකවලට ඔබව රැගෙන යනු ඇත.

මෙහි ඇති සෑම කතාවකම මූලික අරමුණ එකකි - කියවන තැනැත්තා නතර වී සිතන්නට සැලැස්වීම. වචන කිහිපයකින් විශාල ලෝකයක් මවා පෙන්වීම. පැයකට, මිනිත්තු කිහිපයකට හෝ ඔබව එදිනෙදා කාර්යබහුලත්වයෙන් මිදවා වෙනත් ලෝකයකට ගෙනයාම.

මෙම කතා ලිවීමට මට පෙළඹවීමක් වූයේ සාමාන්‍ය මිනිසුන්ගේ අත්දැකීම් ය. පාරේදී මුණ ගැසෙන අයෙක්, පුවතකින් ඇසෙන සිදුවීමක්, රාත්‍රියේ තනියම සිතට එන අදහසක් - මේ සියල්ල මගේ පෑනට ශක්තියක් විය.

මෙම සංග්‍රහය කියවන ඔබගේ හිතට මොහොතකට හෝ සැනසීමක්, ප්‍රශ්නයක්, හෝ සිනහවක් ගෙන දෙන්නට හැකි වුවහොත්, මගේ වෙහෙස සාර්ථක වූවා සේ සලකමි.

ඔබට රසවත් කියවීමක් වේවා...

# පටුන


| | පිටු අංක |
|---|---|
| අම්මා එනතුරු | 1 - 3 |
| කළණ මිතුදම | 4 - 5 |
| සුදු ආතා | 6 - 16 |
| උත්සහවන්තකමට තෑග්ගක් | 17 - 18 |
| රෑ කුමරියෝ | 19 - 20 |
| බකිණි මලේ | 21 - 23 |
| කනේරු මල් | 24 - 25 |
| අවසන් මොහොත | 26 - 28 |
| ඉරණම | 30 - 32 |
| ආපසු ආපු හුස්ම | 33 - 35 |
| එක රෑහේ | 36 - 38 |
| මනුස්සකම | 39 - 40 |

# අම්මා එනතුරු

``පුංචිරාල... පුංචිරාල... ඉක්මනට නැගිටපන්. උදේ 7.00 ත් වෙලා. ආං, උඹට ලොකු නෝනා කතා කරනවා.'' කන දෙදරන්නට තරම් කෑ ගසන ආයා අම්මාගේ කටහඬින් පුංචිරාල කඩිමුඩියේ ඇඳෙන් පැන්නේය. ``මං එනවෝ..... සුභ උදෑසනක් පුංචිරාල'' ආයා අම්මා ද සුභ පැතීය. ``උඹට ලොකු නෝනා කතා කළා. ඉක්මනට පලයන්'' පුංචිරාල දිවියෙකු මෙන් ලොකු නෝනාගේ කාමරය දෙසට දිව්වේය. ටක් ටක්..... ටක් ටක් ``ඇතුළට එන්න''. ඒ ලොකු නෝනාගේ කටහඬයි. ``සුභ උදෑසනක් ලොකු නෝනා.....'' පුංචිරාල ඇමතුවේය. ``සුභ උදෑසනක්''. ``මම උඹට එන්ට කිව්වේ කඩේට ගොහිං බඩු ටිකක් ගේන්ට. උඹට පුළුවන්නේ.....?'' ``පුළුවන් ලොකු නෝනා''. ``එහෙනං මේ බඩු ලිස්ට් එක ලියා ගනිං. ආං කොල්ලෝ මේසේ උඩ කොළයක් ඇති ලියා ගනිං.. ලූණු... සීනි, බිත්තර, බැලුන්.....'' ``බැලුන් මොකටද නෝනා'' ``උඹට වැඩක් නෑනේ. ලියා ගනිං. ලීක්ස්, කැරට්, කීරි සම්බා, සීනි බෝල... මෙච්චරයි. ආයා අම්මත් එක්ක ගිහිං ගනිං.

ආ... මේ රුපියල් තුන්සීයත් ගනිං. උඹට කැමති දෙයක් අරගෙන වරෙංකෝ, හොඳේ.'' කළයකින් මී පැණි උතුරන්නා වාගේ පුංචිරාලගේ සිතට හීන් සතුටක් මෝදු විය. ආයා අම්මත් එක්ක බඩු අරං ආවා. නෝනා දුන්න රුපියල් තුන්සීයෙන් චොක්ලට් පෙති පහයි බනිසෙකුයි ගත්තා. ඉතුරු සීය සාක්කුවේ ඔබාගත්තා. එනගමන් දැක්කා පුංචි බලු පැටියෙක් කෙඳිරිගගා එනවා. එයා එනගමං බනිස

කකා ආපු නිසා බල්ලට දෙන්න මොකුත් නෑ. ඒ නිසා පුංචිරාල දුවගෙන ගියා ළඟ තිබුණු කොළයක් ඇති, ලියා ගනිං. ''කොලුවෝ උඹට මොනාද ඕනේ?'' ''මට පාන් වළලු එකක් ඕනේ'' ''ආ මෙන්න.'' ''රුපියල් දහයයි.'' ''ආ මාමේ'' පුංචිරාල පාන් වළලුත් රැගෙන බල්ලා ළඟට දිව්වා. ආයා අම්මාත් පුදුමෙන් වගේ මේ සිද්ධ වෙන දේ බැලුවා. බව්... බව්... ''ආ පැටියෝ. මේක කන්න'' බලු පැටියා සතුටින් පාන් වළල්ල කෑවේය. පුංචිරාල හා ආයා අම්මා ඒ දෙස බලා සතුටු වී නැවත නිවසට ගියෝය. ''ආ... දැන්ද එන්නේ'' ආ..... මට කියන්න බැරිවුණා. පුංචිරාල කියන්නේ අනාථ ළමයෙක්. එයාගේ අම්මා මේ ගෙදර දොරකඩ ළඟට ඇවිත් දොර ඉස්සරහා තියලා ගිහිං. අයිතිකාරයෙක් නැති පුංචිරාල ඒ දා පටන් මේ ගෙදර තමයි ජීවත් වුණේ. ආ දැන් යමු අපි කථාවට. ''පුංචිරාල උඹ දැං සෙල්ලම් කරන්ට පලයන්.'' වෙනසක් නොදැනුණු පුංචිරාල සෙල්ලම් කරන්ට ගියා. මේ වෙලාවේ ලොකු නෝනායි ආයා අම්මයි හොඳටම වැඩ. ''මේ ඕක ඉක්මනට එල්ලපං.''

''ලොකු නෝනා... දැං පුංචිරාල එන වෙලාව.'' ආයා අම්මා කියනකොට ම පුංචිරාල ආවා. පුදුමයක්! ගෙදරම සරසලා සාලේ මැද කේක් ගෙඩියක්, සීනි බෝල, පැණිකූරු, චොකලට් පෙති ආදි නොයෙක් රසකැවිලි. පුංචිරාල කටට කෙළ එන්නේ පුංචි උල්පතක් වගේ. ඒ වගේ ම නොදන්න කාන්තාවක් ඒත් සමඟම සිටිනවා. ''සුභ උපන්දිනයක්.'' හැමෝම එක හඬින් කතා කළා. ආයා අම්මා කේක් ගෙඩිය අරන් ආවා. කේක් කැපුවා. ආයා අම්මා අර කාන්තාව පෙන්වා කීවා. ''අම්මාට කේක් කවන්න.'' පුංචිරාලට ඇස් අදහාගන්නවත් බෑ. ''අම්මා'' කියාගෙන අම්මා ළඟට ගියා ''මයේ

පුතේ'' අම්මා ආදරයෙන් කතා කළා. ''මගෙ රං කැටේ'' කියාගෙන බදාගත්තා.

''අම්මත් මෙහෙ නවතිනවද'' ''ඔව්.....'' ''හුරේ'' ගාගෙන පුංචිරාල මිදුලට බැස නැටුමකුත් නැටුවා. දැන් ඉතිං පුංචිරාලට හරි සතුටුයි. මාසයක් පමණ යන විට පාසලකට ඇතුළත් කළා. දැං පුංචිරාලගේ නම කමල් පුතා.

**නිමි..**

# කළණ මිතුදම

එකමත් එක සිරිදෙව් කියලා ගමක, ළඟ ගෙවල් දෙකක යහළුවන් දෙදෙනෙක් වාසය කළා. එක් කෙනෙක් සංගීතා වන අතර අනිත් කෙනා සනූජා. මේ දෙදෙනාම සිරිදෙව් පාසලේ 5 වන ශ්‍රේණියේ එකට ඉගෙන ගන්නේ. ගමේ මිනිස්සු මේ දෙදෙනාට කියන්නේ අඹ යහළුවන් කියලා. සංගීතා ඉගෙනීමට හා අමතර ක්‍රීඩාවලට වැනි දේවල්වලට ඉතා දක්ෂයි. ඇය හැම වාරයකම පළමුවන ස්ථානය ලබාගෙන තිබෙනවා. ඇය ගුරුවරුන්ට, දෙමාපියන්ට, වැඩිහිටියන්ට වැනි අයට ගරු කිරීම, කීකරු වීම, කියන දේවල් අසා කටයුතු කිරීම වැනි හොඳ ක්‍රියාවන් කරනවා. ඇයට හැම අතින්ම ප්‍රශංසා ලැබෙනවා. ඇයට හැම අතින්ම ''ඔයා හොඳ ළමයෙක්'' කියන වදනයි. ඒ නමුත් සනූජා එසේ නැහැ. අය දෙමව්පියන්ට, ගුරුවරුන්ට කීකරු නැහැ. ඉගෙනීමට දක්ෂ නැහැ. හැබැයි ක්‍රීඩාවලට ඉතාමත් දක්ෂයි. එයා ළමයින්ගේ පැන්සල්, පෑන් වගේ දේවල් කඩනවා.

එක දවසක් සනූජා ඇයගේ ගුරුතුමිය පාඩම් කියාදෙන අතරතුර ඇය මෙහෙම හිතුවා. ''පාඩම් කෙරිල්ල මහා කරදරයක්. මට නම් දැන් එපාම වෙලා. එව්වා හරිම අමාරුයි. මට දැන් මේ උගන්නන එකත් තේරෙන්නේ නෑ. මට නිකන් ඉන්න බෑ.'' ඉන්පසු සුනූජා, සංගීතාගේ පැන්සල අරගෙන දෙකට කැඩුවා. ඒත් සංගීතා සනූජාට කිව්වා. ''කමක් නෑ, මම ඔයත් එක්ක තරහා නෑ.'' ඒ විටම පන්තිභාර ගුරුතුමිය පන්තියට පැමිණ පසු මෙහෙම කීවා. ''ළමයි

අනිද්දා වාර විභාගය තියෙනවා. හොඳට පාඩම් කරලා එන්න. හැමෝටම සුභ පැතුම්.'' වාර විභාගය හින්දා සංගීතා හොඳට පාඩම් කළා. ඒ වුණාත් සනූජා සෙල්ලම් කළා. වාර විභාගය එළඹුනා. ප්‍රශ්න පත්‍රය දෙනකොට සංගීතා ඒක හොඳට කියවලා උත්තර දුන්නා. සනූජා එයාගේ ප්‍රශ්න පත්‍රයේ කුරුටුබලි ගෑවා. ඊට පසු දවසේ වාර විභාග වෙනියා දෙන දවස ආවා. මේ පාරත් සංගීතා පළමුවන ස්ථනය ලබා ගත්තා. සනූජා පන්තියේ අන්තිමයා වුණා. එයාට දුක හිතුනා. සංගීතා එතනට ඇවිත් එයාට කිව්වා. ''මම ඔයාට ඉගෙන ගන්න උදව් කරන්නම්.'' කියලා. එදා ඉඳලා සංගීතා හා සනූජා පන්තියේ දක්ෂ ශිෂ්‍යාවන් බවට පත් වුණා.

**ඉතින් ඔබත් මේ වගේ යහළුවන් යහමඟට අරගෙන ඔයත් යහළුවන් එක්ක සතුටින් ඉන්න...!**

# සුදු ආතා



එක්තරා ගමක් තිබුණා දෙණිගම කියලා. මේ පුංචි ගමේ. පුංචි පැල්පතක හිටියා කවුරුවත් දන්න කාගෙත් ආදරය දිනාගෙන සිටි සීයා කෙනෙක්. මේ සීයාට ගමේ කවුරුවත් කීවේ සුදු ආතා කියලා.



මේ ගමේ ඉන්න පොඩි ළමයි කතන්දර අහන්න උදේම සුදු ආතගෙ ගෙදර යනවා. ආතා හැමදාම වගේ මේ ළමයින්ට එදත් කිව්වේ, ''මේ කතා ආදර්ශය ගන්න.'' කියලා. අද කියල දුන්න කතාව තමයි, ''අන් අයට හිරිහැර කරන්න එපා'' කියලා.



මේ කතා අහන ළමයි ගොඩේ හිටියා උපුල් කියලා ළමයෙක්. මේ ළමයා කතා අහන්න හරි ආසයි. ඒ වුනාට ඒවා ආදර්ශයට ගන්නේ නැහැ. මේ කතාව අහලා මේ ළමයි ටික සෙල්ලම් කළා. පිට්ටනියේ තමයි සෙල්ලම් කළේ හවස.




මේ ළමයි ගොඩේ හිටපු එක ළමයෙක් තමා විමල් කියන්නේ. එයා අද සෙල්ලම් කරන්න ආවේ නැහැ. ඉතින් මේ විමල් අනිත් ළමයි ටික සෙල්ලම් කරන ඉස්සරහින් පොත් ටිකත් බදා ගෙන ගියා. උපුල් ඇහුවා ''ඒ මේ ඇයි ඔයා අද සෙල්ලම් කරන්න ආවේ නැත්තේ?'' විමල් කිව්වා ''ඉස්කෝලේ වැඩ කරලා ඉවර වෙලා ලොකු තාත්තලගේ ගෙදර යනවා.'' උපුල් කිවාවා ''එහෙනම් ආය ඔයා එන්න ඕන නැහැ.'' කියලා කම්මුල් පහරක් ගැහුවා. විමල්ගේ නහයින් ලේ ආවා. අනිත් යාළුවෝ උපුල්ට බැන්නා. මෙයාව දාන්න එන්න කිව්වට ආවේ නැහැ.



අනිත් ළමයි ටික ගියාට පස්සේ උපුල්ට බය හිතුනා. එයා එයාගේ ගෙදර ගිහිල්ලා කාමරේට ගිහිං දොර වහගෙන හිටියා කවුරුත් කතා කළත් උපුල් දොර ඇරියේ නැහැ.



එයාගේ යාළුවෝ උපුල්ගේ ගෙදර ගියා. ඒ කට්ටියත් දොරට තට්ටු කළාට උපුල් දොර ඇරියේ නැහැ.




ඉන්පසු යාළුවෝ ටික සුදු ආතාගේ ගෙදර ගියා. සුදු ආතාට විස්තරේ කිව්වා. ඊට පස්සේ සුදු ආතා උපුල්ගේ ගෙදර ගියා. එයා තට්ටු කළාම උපුල් දොර ඇරියා. සුදු ආතා උපුල් එක්ක සාලායට ගිහිල්ලා පුටුවක ඉඳ ගත්තා.



සුදු ආතා උපුල්ගෙන් ඇහුවා ''ඇයි ඔයා විමල්ට නිකම් ගැහුවේ?'' ඒත් උපුල් කිව්වේ නැහැ. යාළුවෝ ටික විස්තරේ කිව්වා. ඒ වෙලාවෙ විමල් දෙමාපියන් එක්ක උපුල්ගේ ගෙට ඇතුළු වුණා.



උපුල් ඒ වෙලාවෙම විමල්ගේ අත අල්ලගෙන සමාව ගත්තා ඒ වෙනකොටත් විමල්, උපුල්ට සමාව දී ඉවරයි.



සුදු ආතාගේ ඇසටත් කඳුළු ආවා. ඔන්න ඕක තමයි කිව්වේ ආතා කියන දේ අහන්න කිව්වේ. එහෙනම් ඔන්න ඔහොම තමයි සුදු ආතාගේ කතාව ඉවර වුණේ.



# උත්සහවන්තකමට තෑග්ගක්

කසුන් කියන්නේ ත්‍රිකුණාමලේ ජීවත් වන පුංචි ළමයෙක්. මෙයාට හිටියා පුංචි නංගි කෙනෙක්. කසුන්ගෙ අම්මයි තාත්තයි කුලී වැඩ කරල තමයි ජීවත් වෙන්නේ. අම්මටයි තාත්තටයි හම්බවෙන පඩිය පවුලේ කටයුතු සඳහා මදිවන නිසා කසුන්වයි නංගිවයි පාසලකට යැව්වේ නැහැ. වෙරළේ ඉන්න අනිත් ළමයි සුදු කොක්කු රැනක් වගේ පාසල් යන දිහා කසුන් දුකින් බලාගෙන හිටියා. අම්මයි තාත්තයි රැකියාවට යනකල් කසුන් එයාගේ නංගි සමාරාව බලාගන්නවා. කසුනුයි එයාගේ නංගියි  අම්මයි තාත්තයි ගියාට පස්සේ වෙරළට ගිහිං සිප්පි කටු එකතු කර මාල සදනවා.

කසුන්ගේ හොඳම යාළුවා තමර. තමර පාසල් යනවා. තමර පාසල් ගොස් ආපසු එන විට කසුන්ට වෙරළේ අකුරු කියා දෙනවා. ඒ නිසා කසුන්ටත් අකුරු පුළුවන්. කසුන් චිත්‍ර අඳින්ට හරි දක්ෂයි. පාසලේදී අඳින්න දෙන චිත්‍ර තමර කසුන්ට කියලා තමයි ඇඳගන්නේ. ඒ වෙනුවට තමර කසුන්ට කඩදාසියක් ගානේ දෙනවා. ඉතින් කසුන් ඒ වගෙ චිත්‍ර ඇඳලා බිත්තියේ ගහනවා. ඔන්න එක දවසක කසුන් කොළයක් ඇරගෙන වෙරළට ගිහින් ගලක වාඩි වෙලා මුහුද දිහා බලාගෙන චිත්‍ර අඳින්න සූදානම් වෙනවා.

ඔන්න එක පාරටම උඩ කොටස ගැහැනියක් යට කොටස මාළුවකුගේ හැඩය ගත් කෙනෙක් මුහුදේ ගල් පරයකට වෙලා කසුන් දිහා බලන් ඉන්නවා. කසුන්ට ඒ වෙලාවේ මතක් වුණා එයාගේ

තාත්තා කිව්ව, දිය කිඳුරියන් ගැන. ඉන් පසු කසුන් කොළයක් රැගෙන එම දර්ශනය සිතුවම් කළා. එවිට කසුන්ට ඉතා කරුණාබරිත කටහඬක් ඇසුණා. ''ඔබගේ සිතුවම ඉතා අනර්ඝයි. ඔබට කවදාහරි චිත්‍ර ශිලිපියෙකු වෙන්නට පුළුවන්. ඔබට මම තෑග්ගක් දෙනවා.'' ඒ කටහඬ ඇසුණේ කසුන්ට පිටුපසින්. කසුන් පිටුපස බැලුවා. පොත්, ඇඳුම්, පාට පෙට්ටි, සල්ලි වැනි ද්‍රව්‍ය ගොඩක් තිබුණා.

ඔහු ඒවා ගෙදර රැගෙන ගොස් තම යහළුවාට, නංගීට තෑගි බෙදා දුන්නා. ඉන්පසු එදාපටන් කසුන් පාසල් ගොස් අධ්‍යාපනය හොඳින් හැදෑරුවේ ය. ඔහු දැන් ලොව ප්‍රකට චිත්‍ර ශිල්පියෙකි. එදා දියකිදුරිය කී ප්‍රකාශය සත්‍යයක්ම වුණා. නමුත් තාම කසුන් දන්නෑ එදා ඒක කීවේ, තෑගි ලබා දුන්නේ දියකිඳුරිය කියා. නමුත් කසුන් ඔහුට තෑගි ලබා දුන්නේ කවුරු වුනත් සිතින් ඔහුට ස්තූති කරමිණි.

**නිමි..**

# රෑ කුමාරියෝ

නිමාලි පොත් කියවන්න හරි අසායි. නින්දට යනකොට නිමාලි කතන්දර පොත් කියවනවා. මේ පාර නිමාලිගෙ උපන්දිනයට අම්මා කතන්දර පොත් මිටක් ම තෑගි දුන්නා.

නිමාලි වෙනදා වගේම පොතක් කියවලා නින්දට ගියා. නමුත් නිමාලි රෑ මැද පිබිදුනාය. කාමරේ බාගෙට ඇරී තිබුණු ජනේලෙන් සඳ එළිය ගලා එන්නට විය. නිමාලි ජනේලේ ළගට විත් එළිය බැලුව. තණ මත වැටී ඇති පිනි බිඳු සඳ එළියට මැණික් කැට මෙන් දිස්වේ. සුදු පුළුන් ගුලි මෙන් හා පැටව්, අහසින් කඩා වැටෙන තරු ලෙස පියාඹන කණාමැදිරියෝ රාත්‍රිය අසිරිය වැඩි කරති.

''කොච්චර ලස්සන රැයක් ද?'' නිමාලිට සිතුණි. නිමාලි මේ වගේ රැයක් කවදාවත් දැකලා තිබුණේ නැහැ. හඳහාමි කිරි පාටින් අහස් ගැබේ සිනාසිසී නිමාලි දෙස බලා සිටී. පුංචි තරු කුමාරියෝ හදහාමී වට කරගෙන වත්ත පුරා හඳ එළිය වෙලාගෙන ඇහැළ ගහ ළඟට හා පැටවුන් වඩාගෙන නිමාලි ලඟට සුදු රෝස මලක් වගේ ලස්සන පුංචි සුරංගනාවියක් පැමිණියාය. ලස්සන දිලිසෙන දිග ගවුමටයි. දිගු නීල වරලස ලස්සන කඩුපුල් මලක් වගේමයි. නිමාලිට හිතුනා අත්තම්මා කියන පුංචි රෑ කුමාරි මෙයා තමයි.

''නිමාලි මොකද මේ රෑ නැගිටල. මට මල් නෙලන්න උදව් වෙනවාද'' රෑ කුමාරි ඇසුවා.

“අෑ..... ඔයා මගෙ නමත් දන්නවද’’ කල්පනී ඇසුවා “ඔයා කවුද?” “ මම තමයි රෑ කුමාරි, අපි අර පේන අහසේ ඉදලා රංචු රංචු පිටින් ඇවිත් මල් නෙළනවා’’ නිමාලිගේ මල් වත්තේ මල් ගොඩයි. එයා මල් ගොඩක් කඩලා මල් කුමාරිට දුන්නා. නිමාලි මල් වත්තේ තිබුණු ලස්සනම මල කඩල දුන්නා ඒ වෙනුවට රෑ කුමාරි එයාගෙ ඔළුවේ ගහගෙන හිටපු දිව්‍ය මල නිමාලිට දුන්නා.

“නිමාලි ඔයා මට ගොඩක් උදව් කළා. මම තවත් දවසක එන්නම් ඔයා ගිහිං නිදාගන්න’’ රෑ කුමාරි කාමරයට ඇරලලා මෙහෙම කිව්වා. “මම හැමදාම ඔයාගෙ මල් නෙළනවා. මේ නිසා මම ඔයාට සදාකලික තෑග්ගක් දෙනවා.’’ යි කියා ඇයගේ අත නිමාලිගේ ඔලුව මත තබා අශිර්වාද කර යන්න ගියා. ඔය කට්ටිය දන්නවද ඒ තෑග්ග මොකද්ද කියලා. ඒ තමයි නිමාලි එදා ඉදන් කතන්දර කියවනවා වෙනුවට කතන්දර ලියනවා. දැන් නිමාලී කියන්නේ ජාත්‍යන්තර ලේඛිකාවක්.

**නිමි..**

# බකිණි මලේ

පෙර දිග අහසින් මෝදුවන හිරුගේ රශ්මිය, මුළු පොළෝ තලයම ස්වර්ණ වර්ණ කරයි. උදෑසන කඳු මුදුන් වසාගෙන පාවෙන මීදුම් පටලය, මුළු පරිසරයම අසිරිමත් කරයි. අහසේ තැනින් තැන පුළුන් ගුලි මෙන් විසිරුණු වලා කැටි, උදෑසන සුන්දරත්වය දෙගුණ තෙගුණ කරයි.  උදෑසන හිරු උදාවට කරන ආචාරයක් මෙන්, කුසුම් පිපී දසත වර්ණවත් කරයි. මෙවැනි සුන්දර උදෑසනේ කුසුම්පුරයේ හිරු උදාවත් සමඟ දවස අරඹ සියල්ලෝම වැඩ අරඹති. එයින් සුන්දරත්වය වැඩි වේ.

දෙමට ගොඩට අලුත් දවසක් උදා වෙයි. මේ සුන්දර ගමේ හිටියා සරත් හා සිසිර කියලා නිවුන් ළමයි දෙන්නෙක්. ''පුතාල දෙන්නා නැගිටින්නේ නැද්ද? උදේ වෙලා ඔන්න කිරි එක මේසේ උඩ. කිරි එක බීලා ලැහැස්ති වුනොත් හොදයි'' සරත්ගෙයි සිසිරගෙයි මවගේ කටහඬ හිමිදිරි උදෑසනම ඇසෙන්නට විය. මිනිත්තු කිහිපයක් ගත වුවද ළමුන් දෙන්නා ඇහැරුනේ නැති නිසා අම්මා හැන්දත් රැගෙන ඔවුන්ගේ කාමරයට ගොසින් ''බොහෝම හොඳයි පස්සා පැති දෙකට ඉර වැටෙනකල් බුදි. නැගිටින්න.'' අම්මා ඔවුන්ගේ පස්සට හැදිමිටෙන් තට්ටු කරමින් කියවන්නට විය.

අම්මාගේ හඬින් දෙදෙනාම ඇහැරී කිරි එක බී, උදෑසන ආහාරය රැගෙන, මුහුණ, අතපය සෝදාගෙන පොත්මිටියත් කිහිල්ලේ ගහගෙන අම්මාගෙත් තාත්තාගෙත් දෙපා නැමැද පාසල් යන්න විය. නියර දිගේ ගමේ කඩේ ළගට එකතු වන සරත් හා

සිසිරගේ යහළුවන් වන්නේ අමල්, සුනිල්, කමල් ය. ළමුන් සියළු දෙනාම පාසල් ගොස් එන විට දොළ ළග නියරේ මාදං ගහේ මාදං කඩ කඩ පැමිණියෝය. සිසිරට එක වරම පන්සලේ කොතේ නැග සිටින පුද්ගලයෙක් දක්නට විය. ''දැන් අවුරුදු කාලෙනේ පන්සලේ වෙහෙරේ තීන්ත ගානවා. අපිත් යමු එතනට'' සිසිර කීවේය.

අන් සියලු දෙනාම එම අදහසට කැමති විය. එක පිම්මේ වෙහෙර දෙසට දුවන්නට විය. ''මේ මෙතන ලස්සනයි. මෙතන පොඩ්ඩක් ඉදලා යංකො'' අමල් නුග ගසක වැල් පොදියක් අල්ලාගෙන එල්ලුණේ ය. සියල්ලෝම නුග ගසේ වැල් අල්ලාගෙන පැද්දෝය. අමල් ලොකු පිම්මක් ගෙන නුග වැල අල්ලා ගත්තත් එය අතහැරෙන්නට විය. අමල් රූටා ගොස් ගඟට නොවැටුනේ අනූ නමයෙනි. ''දැං හරිනේ දැං යං තවත් මෙතන ඉන්නැතිව.'' සිසිර කීවේය. සියළු දෙනාම විහාරය දෙසට පියමං කළෝය.

කිරි සුදු පාටින් වෙහෙර බබළන්නට දවස් දෙකකි. සියාතු සීයා වෙහෙර කොතේ හුණු ගානවා පල්ලෙහාට වෙලා ගල්බණ්ඩා සීයා උඩ බලාගෙන ඉන්නවා. ගත වුණේ නිමේෂයකි. ''මාව බේරගනියෝ'' යයි සියාතු සීයා මරලතෝනී දිය. වයසට ගියාට ගල්බණ්ඩා සීයාට හොදට හයි හත්තිය තියන කෙනෙක්. ගලබණ්ඩා සීයා කඹයක් අරගෙන වළල්ලක් හදලා කොත වටේට දමා අනික් කොන ළග ඇති හදුන් ගහේ ගැට ගැහුවා. සියාතු සීයා ඕක දිගේ එල්ලිලා ආවා. ඉතින් ඔහොම පළමුවන දවස ගෙවී ගියා අවුරුද්දට ඇත්තේ තව දවස් 2 කි.

දැන් ඉතින් කුඹුරේ අස්වනු නෙළන කාලේ. පුංචි ළමයි සෙල්ලම් කරනවා. නැන්දලා, මාමලා ගොයම් කපනවා. ඕං එකපාරම දැවැන්ත කුංචනාදයෙක් ඇසෙන්නට විය. බුදු අම්මෝ!!! ගාගෙන ගැහුනු පිරිමි පොරකකා දුවන්නට විය. ලොකු කුලු දෙකක් වගේ කන් දෙකයි. වංගෙඩිය වගේ කකුල් හතරයි, සීගිරි ගල වගේ ඇගයි තියෙන මහ විශාල අලියෙක් ගස් පෙරලාගෙන කමත දෙසට ඇදෙන්නට විය. ගල්බණ්ඩා සීයා කොළ අත්තක් ඇර ගෙන අලියා ගාවට ළං වුණා. ''ගල්බණ්ඩා ඔහොම යන්න එපා'' මිනිස්සු කෑ ගසන්නට විය. නමුත් ඒ කිසිවක් නාහා ගල්බණ්ඩා අලියා ඉදිරියට ගියා.

''බය වෙන්න දෙයක් නෑ. මුගේ කකුලේ කෝට්ටක් ඇනිලා'' ගල්බණ්ඩා කීවා. කොහොමින් කොහොම හරි ගමේ වෙදමහත්තයා ගෙන්නලා අලියව සුව කරලා වනයට යැව්වා. ඉතින් ඔන්න ඔහොම ඒ දවසත් ගතවුණා. පහුවදා හරි අපුරු සිදුවීමක් වුණා. සිසිරයි, සරත්ලයි, යාළුවනුයි ගල්බණ්ඩා සීයා කරපු වීරකම සෙල්ලමක් විදිහට කළා. ගම්මුත් හරි පුදුමෙන් මේක බලාගෙන හිටියා. ඔන්න ඉතින් ඔහොම බකිණි මලේ කතාව අවසන් වුණා.

**නිමි..**

# කනේරු මල්

''අනේ මොකට මේ ළමයා දිවිනහගත්තද'' වයසක ගැහැනියක්. තවත් කාන්තාවකට පවසන්නට විය. ඇය සිටි අසළ හොදින් පිපුණු කනේරු මල් ද, පරවී ගිය කනේරු මල් ද, පොහොට්ටු කනේරු පොහොට්ටු ද තිබුණු කනේරු මල් ගසක් තිබුණි. එයින් මලක් අහුලාගත් පුංචි දරුවෙක් එය කටේ දමා ගැනීමට සූදානම් වෙත්ම ''ආ...හ් චූටි බබෝ ඔය මල් කන්නෑ. එතකොට මයාට ලෙඩ හැදෙයි.'' එතන සිටි අත්තම්මා බියෙන් මෙන් පවසන්නට විය. මේ බව ඇසුනු තවත් කාන්තාවක් ''ඔව් පැටියෝ ඕවා කන්න එපා'' යැයි අවවාද කළා. ''එක්ස්කියුස්මී ආන්ටි මේ රජ්ගේ ගෙදර ද?'' එය ඇසුවේ අවුරුදු 18 ක පමණ වයසැති පිරිමි ළමයෙකි. ''ආ ඔව්. එන්න කාව හම්බෙන්නද'' ''නිර්මලා ආන්ටිව'' මෙය ඇසූ කාන්තාව රජ්ගේ මව වන නිර්මලා ගාවට මේ පිරිමි ළමයා ගෙන ගියා. ''ආහ්!.. ආන්ටි මම මෙතුන් රජ්ගේ යාළුවා. ඇත්තටම ආන්ටි මට ගොඩක් දුකයි. මම දන්නෑ රජ් මොකට මෙහෙම කරගත්තද කියලා. තව දෙයක් ඇන්ටි මට ඇන්ටිට කියන්න දෙයක් තියනවා. කුස්සියෙ කවුරුත් නැත්නම් අපි එතනට යන්'' මෙය ඇසූ නිර්මලා ඉකි ගසමින් ''යං පුතේ'' නිර්මලා මෙතුන් කැටුව කුස්සියට ගොස් තේ සාදා ඉදගැනීමට ආසනයක් ලබා දුනි. තේ පානය අතරතුර ''ආන්ටි මම මේ කියන්න ආවේ, රජ් ඔය වැඩේ කරගන්න කලින් දවසේ අපේ ගෙදර ඇවිල්ලා මා ගාවට වෙලා හුගක් ඇඩුවා. එයා කීවා එයාට ගොඩක් හිතේ අමාරුලු O/L වලට A9 දාගන්න බැරි වුණා නිසා එයා

මට ඩයරියක් දුන්නා... මේ...'' මෙතුන් කියන්නත් කලින් ''අනේ පුතේ මේ ළමයා ඒකටද මේක කරගත්තේ'' ''අනේ නෑ නෑ ආන්ටි... මේක අහලා ආන්ටි බය වෙන්න එපා. ආන්ටි රජ් විභාගේ ඉවර වුණ දවසේ ඉඳලා O/L ගැන හිත හිතා. මට හැමවෙලේම රජ් ''අනේ මචං තාත්තත් නැති වුණා. අම්මා මං ගැන කොච්චර බලාපොරොත්තුවෙන් හිටියේ. O/L කෙළවෙයිද මචං'' රජ්ගේ කටේ තිබ්බෙම ඕක. මං කියනවා හැමවෙලේම ''අයියෝ ඕක හැමවෙලේම කියවන්න එපා. අඩුම තරමේ රජ්ට A පාස් හතක් වත් ගන්න පුළුවන් කියලා.'' ඉතිං ඔය පොතේ අන්තිම පිටුවේ ලියලා තියෙන්නේ ''කනේරු මල කෙතරම් සුන්දර වුවත්, ජීවිත තප්පරයකින් විනාශ කිරීමට හැකියාව තිබේ. මේ රජ්ගේ අවාසනාවන්ත මරණයයි'' කියලා. මිනිහා කිසි ගැලපීමක් නැතිව ලියලා තියෙන්නේ හැබැයි එක කාරණාවක් හොඳට තේරෙනවා. O/L ඉවර වෙලා මාසයක් විතර ගියාට පස්සේ මෙයා අපේ ගෙදර එහෙම ඉන්නකොට කැරකිල්ලක් එනවා. එක දවසක් රජ් එක්ක මම ඩොක්ට කෙනෙක් ගාවට ගියා. ඩොක්ට කීවා මොකද්දෝ මානසික ලෙඩක් කියලා. හැබැයි දිගටම ප්‍රතිකාර කරොත් මාස තුනකින් ලෙඩේ හොඳවෙයිලු. මේ ලෙඩේ ගොඩක් අයට හැදිලා ප්‍රතිකාර කරපු නිසා බේරිලා. මේක රජ්ට ඇහිලා ''මිතුන් මේ ගැන අම්මාට දැනගන්න තියන්න එපා'' රජ් මේ ගැන හිත හිත ඉදල තමා කනේරු ඇට කාලා මේවගේ දෙයක් කරගෙන තියන්නේ ගත වූයේ නිමේෂයකි. ''අනේ මයෙ පුතේ'' කියාගෙන නිර්මලා ඔළුවේ අත ගහගෙනම කෙසෙල් කඳක් වැටෙන ලෙසට වැටුණි.

නිවස අසළ තිබූ කනේරු මල් ගස මද සුළඟට වැනෙන්නට විය. සුළඟේ පාවී ආ නැවුම් කනේරු මලක් පාවී ගොස් රජ්ගේ නිසල දේහය මතට වැටුනි.

**නිමි..**

# අවසන් මොහොත

''හරි හරි දැන් ලෙඩ්ඩු බලන්න ආව අය යන්න. ලොකු ඩොක්ට එනවා.'' 07 වෙනි වාට්ටුවේ හෙදිය කියන්නට වූවාය. පිළිකාවක් නිසා දුක්විඳින පියවතී කලබල වනන්ට විය. "පියවතී නෝනා බයවෙන්ට එපා. ඔයාව බලන්න ඉන්න කට්ටියට ඕන වෙලාවක ඉන්න ඩොක්ට පර්මිෂන් දීලා තියෙන්නේ."

නොනවත්වා ඇසෙන MRI යන්ත්‍රවල ශබ්දයත්, අප්‍රසන්න බෙහෙත් ගන්ධයත් මුළු වාට්ටුව පුරා පැතිරී තිබුණි. ''අම්මා... අම්මා තාමත් ඉඩම් ප්‍රශ්න ගැනද හිතන්නේ.'' පියවතීගේ පුතා වූ රුවන් අසන්නට වූවේ කුතුහලයෙනි. නමුත් පියවතීගෙන් පිළිතුරක් නොවුනි. ඒ වෙලාවේ පියවතී අතීතයට පිය මනින්නට විය. ගමෙහි ඉහළ පැලැන්තියේ ජීවත්වන පියවතී ඉතා සැපවත් ජීවිතයක් ගත කළත් සිටියේ නිතරම කෝපයෙනි. පියවතීගේ ස්වාමියා මිය ගොස් දැනට අවුරුදු අටකි. ඇය සිටින්නේ තම පුතා වන රුවන් හා ඔහුගේ පවුල සමඟයි. පියවතීගේ නිවසට පසෙකින් ජීවත් වන්නේ සුමනා නම් මැදි වයසේ පසුවන කාන්තාවක් හා ඇයගේ පවුලයි. ඔවුන් තම නිවස සදාගෙන ඇත්තේ පියවතීගේ ඉඩමේයි. නමුත් සුමනා නිතර නිතරම පවසන්නේ මේ ඔවුන් මුදල් දී ගත් ඉඩමක් බවයි. මෙලෙස ගමේ උදවිය සමඟ නිතර ආරවුල් ඇත් කර ගනී. තමන්ගේ ඉඩමේ වැවී ඇති කොස් පොළොස්, පොල් ගෙඩියක්වත් කඩා ගැනීමට නොදෙයි. එක් දිනක් සේනක නම් ගමේ පුද්ගලයෙක් රුවන්ගේ කීමට පොල්වත්තේ පොල් ගස්වල පොල් කඩන අතරතුර මෙය නොදත්

පියවතී සේනකට ගල් කැට ගසමින් සිටියදී ලොකු ගල් පතුරක් ගැලවී ගොස් සේනකගේ පිටේ වැදී ඉස්පිරිතාලේ පවා ගෙනියන්න සිදු විය. පියවතීගේ සිතට තවත් සිදුවීමක් සෙමින් ඇතුළුවන්නට විය. එනම් ගමේ කොලුගැටයෙක් වෙසක් පුන් පොහෝ දා පන්සල් යාමට මල් කඩා ගැනීම සඳහා පියවතීගේ මල් වත්තට වැද මල් කඩා ගන්නා ආකාරය දැක පියවතී අතේ තිබූ කොසු මිටක් රැගෙන පුංචි කොල්ලාට ගහන්නට වුණා. පසුවදා එම ළමයාගේ දෙමාපියන් පැමිණ පියවතීට බැණ වදින්න විය. පසු දිනක පියවතී ගෙට එපිටහ පදිංචි වී සිටින සුමනාගේ ස්වාමියා වන කපිල සමඟ අඩදබරයක් ඇති කරගත්තේ පියවතීගේ වත්තට සුමනාගේ වත්තේ අඹ ගහේ අත්තක් වැටී ඇති නිසා තම වත්ත අපිරිසිදු වන නිසා මේ දෙන්නා අතර බහින් බස් වීමක් වුණි. මෙසේ රණ්ඩු සරුවල් වන අතරතුර කෝට්ටක පියවතීගේ පපුවේ ඇති එහි තිබූ කීරක් පපුව තුළ ඇනීම නිසා ඉස්පිරිතාලයට රැගෙන ගොස් සීටී ස්කෑන් පරීක්ෂාවක් කරන විට ඇයට පිළිකාවක් වැළදී ඇති බව පෙන්නුම් කෙරුණි. මෙය කීවේ රුවන්ට පමණි. පියවතී තව මාස දෙකක් ජීවත් වීමට හැකි බව දොස්තර මහතා කීවේ සංවේගය පලකරමිනුයි. මෙය ඇසූ රුවන් මවට සතුටු විය හැකි දේ උපරිම ලෙස ඉටු කළේය.

පියවි ලොව සිහියට පැමිණි පියවතී තමන්ගේ අවසන් හෝරාව ගත කරන්නට විය. ''අම්මේ... ඔයා තාම ඉඩම් ප්‍රශ්න ගැන නෙවේනෙ කල්පනා කරන්නේ'' ''ආ... ආ... නෑ පුතේ... පුතේ, මෙහෙ වරෙන්කෝ. මට බණ පොඩ්ඩක් අහන්න දෙන්න පුළුවන්ද.'' ''ආහ්... අනේ අම්මේ'' පියවතී හුස්ම අදින්නට විය. ''අම්මේ අයියෝ''

පියවතීගේ හඬ ටිකෙන් ටික අඩු වන්නට විය. රුවන් එකවරම ''අම්මා'' යන හඬින් කෑ ගසන්නට විය.

**නිමි..**

# ඉරණාම

ෆේස්බුක් එකේ පලවී තිබූ සටහනක් වෙත මාගේ නෙත දිව්ගියේ මටත් හොරාය. එහි පළවී තිබූ ඡායාරූපයේ සිටියේ මා මීට අවුරුදු දහයකට පමණ පෙර මාගේ මිතුරිය වූ ජේසිකා එහි පළවී තිබූ සටහන කියවන විට මට නොදැනීම සිහිවුණේ මීට අවුරුදු දහයකට පෙර මා හා ජේසිකා සිටි අන්දම ගැනයි.

මා අවුරුදු පහළොවේ දී පමණ පාසලේ පිහිණුම් ක්‍රීඩා සමාජයේ සාමාජිකයෙක් වුණු දිනේ. ජේසිකා එඩ්ම්බ්‍රෝ මාගේ මිතුරිය වුණි. අවුරුදු දහනවයේ දී අප දෙදෙනා පිහිනුම් ක්‍රීඩාව ඉතා දක්ෂ ලෙස හැදෑරුවා. පුරුදු පුහුණු කළ ඩොල්ෆින්ලා සමඟ සංදර්ශන කරමින් ජේසිකා හා මා විශාල මුදලක් උපයා ගත්තෙමු. පෙර දිනයන්හි උදෑසනම අවදි වී ඉක්මනට ලකලෑහැත්ති වී තමාගේ ඩොල්ෆින්වන රෝනාව පිරිසිදු කිරීමට පැමිණෙන්නේ රෝනාට ප්‍රතිඋපකාර කරන්නට මෙනි. විවිධ සංදර්ශන පවත්වමින් මුදල් හම්බ කරගැනීමට උදව් කළ රෝනාට ඇය කවමදාවත් පරුෂ වචන කියමින්, ගහන්නේවත් නැත. තමන්ගේ දරුවෙක් වගේ රෝනාව බලාගත්තේ. මා හට නම් මාගේ ඩොල්ෆින් මත්ස්‍යයා එතරම් ඇගෑලුම්කම් පෑවේ නෑ. සංදර්ශන කටයුතු අතර රෝනාගේ උල් දත් අතරින් මුඛයට රිංගා ගොස් නැවත පැමිණීම වැනි සියලුම අවදානම් ක්‍රියා කරන්නේ ජේසිකාය. මේ අතරතුර මා අනතුරකට ලක් වූ නිසා මාස තුනක් පමණ නිවසට වී සිටින්නට විය. එවිට ජේසිකා මා බැලීමට නිතරම එන්නේ, මාගේ ඕනා එපාකම් හොයා බලන්නේ මවක් ලෙයසි. එම දිනයන්හි ජේසිකා සංදර්ශන කළේ රෝනා

සමඟයි. මාගේ පාදය සුව වුවත් මාගේ මව නැවත සංදර්ශන කිරීමට නොයෑමට බල කළේ විශ්ව විද්‍යාලයට තේරී පත් වූ නිසා ය. ජෙසිකා ද මා ද විශ්ව විද්‍යාලයට තේරුණද ජෙසිකා විශ්ව විද්‍යාලයේ ගමන අතහැර රෝනා සමඟ පුහුණුවීම් කටයුතු කරමින් සංදර්ශන කළාය. මාගේ මවගේ තරවටුකම් නිසා මා නැවත ඒ සඳහා නොගියේ ය. නමුත් ජෙසිකාගේ මෙතෙක් කල් තිබූ සෑම සංදර්ශනයටම මා ප්‍රේක්ෂකයෙකු ලෙස සිටියෙමි. ජෙසිකාගේ අවසන් සංදර්ශනය පවත්වනු ලැබුවේ 2025 වර්ෂයේ ජනවාරි 5 වන දිනයෙහි. එදා වූ ඒ අවාසනාවන්ත සිද්ධිය මාගේ මතකයේ ගලේ කෙටූ අකුරක් සේ සඳහන් විය. එම දින ජෙසිකා සුපුරුදු පරිදි උදෑසන රෝනාට කන්නට මාළු දී රෝනාව පිරිසිදු කළේ සන්ධ්‍යාවේ ඇති සංදර්ශනයට ලැහැස්ති කිරීමට. සංදර්ශනය පටන් ගන්නා අවස්ථාවේ ජෙසිකා ඉතා දක්ෂ ලෙස රෝනාගේ මුඛයේ තුඩ උඩ ඉතා සමබර ලෙස සිටගනිමින් විවිධ දස්කම් පෑවාය. ඊළඟට තිබූ අංගයනම් ප්‍රේක්ෂකයෝ නිතර අමන්දානන්දයට පත් වන අංගයකි. පුරුදු ලෙස රෝනාගේ උල් දත් අතරින් විශාල මුඛය තුළට ගොස් විවිධ දස්කම් පෑවාය. වෙනදා මෙන් රෝනා ජෙසිකාව මුඛයෙන් පිටතට දමන තෙක් අප නොඉවසිල්ලෙන් පසුවුනෙමු. නමුත් සිදුවූයේ කුමක්ද? ජෙසිකා පණ මෙන් රැකගත්, ආදරකළ රෝනා ඇයව සෙමන් කුට්ටියක් ලෙස හපන්නට පටන් ගත්තේ කළගුණ නොදත් අයෙකු මෙනි. රෝනා මේ කරන්නේ හිතේ තිබූ තරහවක් නිසා ද බව මට නොවැටහුණි. මා ඉක්මනට මා අසුන්ගෙන සිටි ප්‍රේක්ෂකාගාරයෙන් දුවවිත් තටාකයට පැන රෝනාව මෙල්ල කර ජෙසිකාව ප්‍රවේසමෙන් රෝනාගේ මුඛයෙන් ගත්තේ ජෙසිකා මිය යන්නට නැතැයි දෙගිඩියාවෙනි. නමුත් සියල්ල

කනපිට හැරී අවසානයි. තමාට මවක් ලෙස සිටි ජේසිකාට රෝනා මෙසේ කිරීමට සිත් පහළ වූයේ කෙසේද? රෝනාගේ නෙත් අග කඳුළු බිඳු රැඳී තිබුණු බව මට මතකය. මා ජේසිකා රෝනාගේ මුඛය තුළින් ගන්නා විට රෝනාගේ මුඛයේ එකම ලේ විලකි. දුටුවන්ට බිය උපදවන සුළු දසුනක් විය. ජේසිකා රෝහල වෙත රැගෙන ගියද ඒ වන විටත් ජේසිකා මිය ගොස් ඇත. අවසන් මොහොතේ ඇය මට කීවේ ''රෝනා මට මෙහෙම කළේ ඇයි දන්නෑ. එයත් සතෙක්නේ. කමක් නෑ. රෝනාව හොද... හොදට බලාගන්...න'' ඒ ජේසිකාගේ අවසන් වදන් පෙළයි. පසුවදා ජේසිකාගේ අවමංගල්‍ය කටයුතු සිදුකළේ රෝනා සිටි පිහිනුම් තටාකය අසලයි. ජේසිකාගේ නිසල දේහය මත රෝනා බලා සිටියේ තම මව නැති වී අඩමින් සිටින කුඩා දරුවෙකු ලෙසිනි. නැවත එම අවාසනාවන්ත සිදුවීම මාගේ මනසේ පෙළගැස්වෙන විට මාගේ නෙතට නොදැනීම කඳුළු ඉනුවේ මටත් හොරාය.

**නිමි..**

## ආපසු ආපු හුස්ම

මාගේ දින දින පොත පෙරලන විට තිබුණේ මෙම කතාවයි පිටුවෙන් පිටුව කියවන විට මගේ හදට විශ්ව මාතාව පිළිබඳ දැඩි ඇල්මක් ඇතිවුණි.

අනුව ගණන්වල ගමක කුඩා රෝහලක්. විදුලිය නැති රැවල්, බෙහෙත් නැති දවස්, ඒත් මිනිස්සුන්ගේ ආදරේ තියෙන තැනක්.

ගමේ හැමෝම කිව්වා "සරත් ඩොක්ටර්ට පිස්සු" කියලා.

එදා රෑ දෙකට විතර රවීන්ව අරගෙන ආවේ මැරිලා වගේ. වයස අටයි. හදවතේ සිදුරක්. නගරේට අරගෙන යන්න සල්ලි නැහැලු, වෙලාවත් නෑ. සරත් ඩොක්ටර් තීරණය කළා - තමන්ගේම ලේ දෙන්න.

ඒ කාලේ ලේ බැංකු නෑ. එයා තමන්ගේ ඇඟෙන් ලේ අරගෙන රවීන්ගේ ඇඟට දැම්මා. පැය හයක් සැත්කම. "මගේ ජීවිතෙන් කොටසක් දෙනවා, පුතේ" කියලා මුමුණලා සරත් ඇස් පියාගත්තා.

රවීන් බේරුණා. සරත් සති දෙකක් ඇඳේ. මිනිස්සු කිව්වා "උඹ මැරෙනවා ඩොක්ටර්" කියලා. එයා හිනා වෙලා කිව්වා "එකෙක් බේරුණා නම් ඇති".

කාලය ගියා. රවීන් හොඳට හැදිලා කොළඹ ගියා, ඉංජිනේරුවෙක් වුණා. සරත් ගමේම හිටියා. කසාදයක් බැන්දේ නෑ. "මිනිස්සු තමයි මගේ පවුල" කිව්වා.

අවුරුදු තිහක් ගියා.

සරත්ට දැන් හැත්තෑවයි. තනියම, අතපය වෙව්ලනවා. එක දවසක් රෑ පාරේ යද්දී හදවත් වේදනාවක් ඇවිත් පාරට වැටුණා. වටේ හිටපු කවුරුවත් ළං වුණේ නෑ. "කවුද දන්නේ මේ මිනිහා කවුද කියලා" කියලා මිනිස්සු මඟ ඇරියා.

ඒ වෙලාවේ කළු කාර් එකක් නතර වුණා. ඇතුලෙන් බැහැලා ආපු  හතළිස් ගණන් වයසැති මිනිහා සරත්ව තුරුළු කරගෙන කිව්වා "ඩොක්ටර්, මාව අඳුරනවාද?"

සරත්ගේ ඇස් බොඳ වුණා. ඒ මූණ... ඒ ඇස්...  අවුරුදු ගානකට කලින් එයාගේ ඇඟේ ලේ දුවපු ළමයා.

"රවීන්...?"

"ඔව් ඩොක්ටර්. අද මම ආවේ ඔයාගේ හදවත බේරගන්න".

රවීන් එදා රෑම සරත්ව කොළඹ ගෙනියලා සැත්කම කළා. "ඩොක්ටර්, ඔයා මට ජීවිතේ දුන්නා. අද මම ඔයාට ආපසු දෙනවා. ඒක පොලිය එක්ක".

පාරේ මැරෙන්න වැටිලා හිටපු සරත්, තමන් ජීවිතේ දුන් ළමයා අතින්ම ආයෙත් ජීවිතේ ලබන මොහොත. ඒක සැලසුමක් නෙවෙයි,

අහඹුවක්. ඒත් ඒ අහඹුව පිටිපස්සේ අවුරුදු තිහක් තිස්සේ ගෙවපු කරුණාවේ පලය තිබුණා.

සරත් ආයෙත් ගමට ආවා. හැබැයි තනියම නෙවෙයි. රවීන් සතියකට සැරයක් ඇවිත් බලනවා. ගමේ ළමයි දැන් කියන්නේ "අපේ ඩොක්ටර්ගේ පුතා ආවා" කියලා.

කරන යහපත කවදාවත් නැති වෙන්නේ නෑ. ඒක විශ්වයේ කොහේ හරි ගබඩා වෙලා, හරි වෙලාවට පොලිය එක්ක ආපසු එනවා. කරුණාව කියන්නේ ණයක් - කාලයයි පොලිය.

# එක රෑනේ

එක පිලේ ඉඳගෙන බත් කමින් සිටියදී නිමල් දෙසමා බලා අතීතයට දිව ගියේ නොදැනීමය.

නිර්මලාගේ ගෙදරට ගියේ සඳුන් අම්මා එව්වා නිසා. "ගෙවත්තේ කොස් දෙකක් තියෙනවා. ඉදිලා වැටෙනවා. ගිහින් කඩාගෙන වරෙන්" කියලා.

සඳුන් ගියා. කොස් කඩන ගමන් නිමල්ව දැක්කා. එයා අඬනවා. "ගණිතේ ෆේල් උනොත් අම්මා ගහනවා" කියලා.

සඳුන් කිව්වා "මට පෙන්නපල්ලා, මම උගන්වන්නම්".

නිර්මලා දැක්කා. "ආ... හිඟන්නගේ පුතා! උඹේ වගේ එකාගෙන් මගේ පුතා පාඩම් අහනවද?" කියලා සඳුන්ට බැන්නා. සඳුන් නිශ්ශබ්දව හිටියා.

ඊට පස්සේ හැමදාම නිමල් සඳුන්ව හොරෙන් එළියට කැඳෙව්වා. "මල්ලි, මේක විසඳපන්කෝ". සඳුන් රෑට පන්දම ගහගෙන නිමල්ගේ සටහන් පොත් අරගෙන තමන්ගේ පැල්පතේ ඉඳගෙන පාඩම් බැලුවා. එයාට තමන්ගේ පාඩම්වලට වෙලාවක් නෑ.

එක දවසක් නිමල්ගේ සටහන් පොත ඇතුලළින් පැරණි ෆොටෝ එකක් වැටුණා. ඒකේ නිමල්, එයාගේ අම්මා, තාත්තා, තව

ළමයෙක් ඉන්නවා. ඒ ළමයා නිමල් වගේමයි. හරියට නිවුන් සහෝදරයෙක් වගේ.

"අම්මේ, මේ කවුද?" නිමල් ඇහුවා.

නිර්මලා ෆොටෝ එක උදුරගෙන ඉරලා දැම්මා. "ඒ මැරුණු එකා! ආයෙත් ඒ ගැන අහන්න එපා.

සඳුන් ඒක දැක්කා. ඒ ළමයාගේ ඇස්... ඒ ඇස් එයාගේ අම්මගේ ඇස් වගේමයි.

මාසෙකට පස්සේ ගමේ මහත්තයා මැරුණා. එයාගේ අවමඟුලේදි නිර්මලා අඬ අඬා කිව්වා: "මගේ මහත්තයා මැරෙන්න කලින් කිව්වා... නිවුන් දරුවෝ දෙන්නා ඉපදුණා. එකෙක් පොහොසත් කරන්න, අනිකා දුප්පත් කරන්න කියලා. මම බය වුණා... ඉතින් සඳුන්ව එයාගේ අම්මා ළඟ තිබ්බා".අයියේ ඔය බත් එක කන්න සීතල වෙයි.අතීතයෙන් ගැලවුණ මම එකපාරම පියවි සිහියට පැමිණුනේ නිමල්ගේ කටහඬටය.

ඒ මොහොතේ සඳුන්ට තේරුණා. හැමදාම තමන්ට බනින ගෑනි තමන්ගේ අම්මා. තමන් උගන්වපු නිමල් තමන්ගේම සහෝදරයා.

නිමල් දුවගෙන ඇවිත් සඳුන්ව තුරුළු කරගත්තා. "මල්ලි... මම දැනගෙන හිටියේ නෑ".

නිර්මලා දවස් ගාණක් කතා කළේ නෑ. ඊට පස්සේ එයා සඳුන්ව ගෙදරට ගෙනාවා. "මාසෙකට සැරයක් උඹලා දෙන්නා තැන මාරු

කරගනින්. එක මාසේ උඹ රජ පුතා, අනිකා හිඟන්නා. එතකොට මනුස්සකම තේරෙයි" කිව්වා.

ගමේ මිනිස්සු අදටත් කියනවා: "සටහන් පොතක් ඇතුළේ තිබ්බේ පාඩමක් .පින්තූරයක් නෙමේ.

අයියේ ඔය බත් එකේ ඉක්මනට කන්ඩ හීතල වෙයිද තිගැස්සී මා පියවී සිහියට පැමිණුනේ නිමල්ගේ කටහඬිනි.

# මනුස්සකම

මගේ නම අභිෂේක්. වයස පහළොවයි. මම පරිගණකය ගාව වාඩිවෙන්නේ පාඩම් කරන්න නෙවෙයි. මගේ තාත්තා අඩපු දවසේ ඉඳලා මම යුද්ධයක් පටන් ගත්තා.

තාත්තා වෙළඳසලේ උපයන සල්ලි ටිකක් "ලොතරැයිය දිනුවා" කියන බොරු පණිවිඩයකට රැවටිලා නැතිවෙලා ගියා. රෑට තාත්තා කියපු "මගේ මාසෙක මහන්සිය බං" කියන වචනය මගේ ඔළුවේ ඇණ ගහගෙන තිබුණා.

එදා ඉඳලා මම හොර රැවටීම් ගැන ඉගෙන ගත්තා. පොතක් අරගෙන, ජාලයෙන් බලාගෙන, මම ස්වයංක්‍රීය වැඩසටහනක් හැදුවා. ඒකේ වැඩේ එකයි.

ගමේ කවුරුහරි සැක සහිත පණිවිඩයක් එව්වොත්, මගේ වැඩසටහන ඒක කියවලා බලනවා. "මේක රැවටීමක්ද නැද්ද" කියලා. රැවටීමක් නම්, "මේකට රැවටෙන්න එපා. තහවුරු කරගන්න" කියලා ආපසු පණිවිඩයක් යවනවා.

පළවෙනි මාසේ මම ගමේ මිනිස්සුන්ගේ රුපියල් හතළිස් දාහක් විතර බේරගත්තා. දෙවෙනි මාසේ ලක්ෂයකට කිට්ටු වුණා.

හැබැයි ඇත්ත ප්‍රශ්නේ ආවේ ඊට පස්සේ.

එක රෑක මගේම මාමාගේ කටහඬින් පණිවිඩයක් ආවා. "පුතා, රෝහල් බිලට ටිකක් ඕනේ. මේ ගිණුමට දාන්න". කටහඬ ඇහුණේ මාමාම කතා කරනවා වගේ. මගේ වැඩසටහන කිව්වා 90% කට වඩා රැවටීමේ ඉඩ තියෙනවා කියලා.

ම එතනදි තේරුම් ගත්තා. යන්ත්‍රයකට හැමදේම හොයන්න බෑ. මාමාට කතා කරලා ඇහුවාම තමයි දැනගත්තේ, එයාගේ කටහඬ

හොරෙන් අරගෙන, පරිගණකය යොදාගෙන හදපු බොරු හඬක් කියලා.

එදා ඉඳලා මම වැඩසටහන වෙනස් කළා. දැන් ඒක කියන්නේ "මේක රැවටීමක් වෙන්න පුළුවන්. කතා කරලා තහවුරු කරගන්න" කියලා විතරයි. තීරණය ගන්නේ මනුස්සයා.

ඊට පස්සේ මම පාසලේ මිතුරෝ ටිකක් එක්ක එකතු වෙලා, ගමේ මහලු අයට පාඩම් කරන්න ගත්තා. "නොදන්නා අංකයකට සල්ලි යවන්න කලින් දෙපාරක් හිතන්න. සබැඳියක් ඇල්ලුවට කලින් බලන්න" කියලා අපි පෙන්නුවා.

දැන් ගමේ අය කියන්නේ "අභිෂේක්ගේ වැඩසටහන නිසා අපිට නිදහසේ හුස්ම ගන්න පුළුවන්" කියලා.

ම දන්නවා මේකෙන් ලෝකය වෙනස් වෙන්නේ නෑ. ඒත් මගේ ගමේ එක කෙනෙක්වත් අඬනවා දකින්න මට ඕනේ නෑ.

පරිගණක කේතයට හදවතක් එකතු කළොත්, ඒක මිනිස්සු රැකගන්න ආයුධයක් වෙනවා.

**නිමි**

# ස්තූතිය

නිරන්තරයෙන් මගේ අධ්‍යාපන කටයුතු පිළිබඳ
දිනෙකමින් සොයාබලමින්, මට රැකවරණය දෙමින්
මාව පෝෂණය කරන ආදරණීය අම්මටත්,
අප්පච්චිටත්, මගේ සහෝදරියන්ටත්,

ඥාති හිතමිතුරන් සැමදෙනාටත්,

ගුණයෙන් නැණයෙන් හා යහමග යැවීමට
මාර්ගෝපදේශ සපයන ස්වර්ණමාලි විදු බිමේ
විදුහල්පතිනිය ප්‍රමුඛ ඇදුරු මඩුල්ලත්, 'අ' යනු 'ආ'
යනු කියූ සිදුහත් විදු පියසේ ඇදුරු මඩුල්ලටත්,

බස පිරික්සමින්, ඔවදන් සපයමින් මා දිරිමත් කරන
සිසිර ගමගේ සීයාටත්, මේ අවස්ථාව ලබා දුන්
මහමායා විදුහලේ සෙනෙවිරත්න ගුරුපියාණන්ටත්,
මගේ සදාදර යෙහෙළියන්ටත් මේ ග්‍රන්ථය සෙනෙහෙ
සිතින් පුදමි....

# පසුවදන



අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂ්‍යයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිශීලනය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබා දිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වා ගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් "හේමමාලා උපහාර" ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත් වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටු කළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලමෙතුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සත්කාරය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)